හිරු ටීවී ප්‍රධාන ප්‍රවෘත්ති විකාශය ඔස්සේ දිවි අහිමි කර ගැනීමේ සිදුවීම් කිහිපයක් වාර්තා කෙරෙන අතර, දිවි අහිමි කර ගැනීම් සම්බන්ධව ගෝලීය සංඛ්‍යාලේඛන කිහිපයක්ද එහිදී දැක්වේ. ඒ සම්බන්ධයෙන් අප කළ නිරීක්ෂණයන් මෙසේ සටහන් කරමු.
සෑම තත්පර 40 කටම වරක් පුද්ගලයකු දිවි නසා ගන්නා බවටත්, එම සංඛ්‍යාව ලක්ෂ අටක් වන බවටත් ලෝක සෞඛ්‍ය සංවිධානය උපුටා දක්වමින් ඉදිරිපත් කර ඇති සංඛ්‍යාලේඛන නිවැරදි වේ. ඒ සඳහා නිවැරදි මූලාශ්‍ර දක්වා තිබීම ද ප්‍රශංසා කටයුතු වේ.
ගෝලීය ව සිදුවන දිවි අහිමි කර ගැනීම ප්‍රමාණයෙන් ශ්‍රී ලංකාව 29 වන තැනට පත් වන බවට සිදුකෙරෙනා ප්‍රකාශය නිවැරදි යැයි ගත හැකි වූවත්, ඒ සඳහා නිවැරදි සහ අදාළ මූලාශ්‍ර දක්වා නොතිබීම අඩුපාඩුවක් වේ.

ලොව පුරා සිදු වන මරණ වලට බලපාන ප්‍රධාන සාධක 10 අතරින් එක් ප්‍රධාන සාධකයක් වන්නේ දිවි අහිමි කර ගැනීම බවට ප්‍රවෘත්ති නිවේදක විසින් දක්වන තොරතුර සඳහා මූලාශ්‍රයක් දක්වා නොමැති අතර, එම තොරතුර නිවැරදි යැයි කිව හැකි දත්ත අපට මෙතෙක් හමුවී නැත.
මේ අනුව අවධාරණය කළ යුත්තේ, මෙවන් දත්ත ඉදිරිපත් කිරීමේදී විශ්වාසනීය හා නිවැරදි මූලාශ්‍ර පරිශීලනය සහ එම මූලාශ්‍ර ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වන බවයි.

එසේම දිවි අහිමි කර ගැනීම් සම්බන්ධයෙන් වන මෙවැනි පුවත් වාර්තාවන් ඉදිරිපත් කිරීමේ දී, ඒ සමගින් හදිසි උපකාරක අංක ද සඳහන් කිරීමද යෝග්‍ය බව මෙසේම පවසමු.හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926

#MediaEthics #lka #SinhalaNews #TVchannels #HiruTV